ශීර්ෂය 259 - මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය

---

ශීර්ෂය 259 - මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූනි 21 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම.

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2. ගිණුම්

-------

2.1 විසර්ජන ගිණුම

----------------

(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

---------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 768.15 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 622.44 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 145.71 ක් හෙවත් සියයට 18.97ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 556.15 | 552.48 | 3.67 | 0.66 |
| මූලධන | 212.00 | 69.96 | 142.04 | 67.00 |
| **එකතුව** | **768.15** | **622.44** | **145.71** | **18.97** |

(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ 21 ක් හා දෙපාර්තමේන්තු 17 ක් විසින් එකතුව රු.මිලියන 2,652 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,837 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 815ක් (ශුද්ධ) හෙවත් සියයට 31 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 25901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 41.75 | 38.23 | 32.75 | 33.55 | 150.00 | 126.24 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 06 ක 2015 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන198.80 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු. මිලියන** |
| 6000/0000/00/0001/0054/000 | 0.88 |
| 6000/0000/00/0002/0072/000 | 0.71 |
| 6000/0000/00/0013/0044/000 | 64.92 |
| 6000/0000/00/0016/0024/000 | 111.88 |
| 6000/0000/00/0017/0005/000 | 19.53 |
| 6000/0000/00/0018/0031/000 | 0.88 |
| **එකතුව** | **198.80** |

2.4 විගණන නිරීක්ෂණය

මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ.**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් විසින් පහත සඳහන් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ආයතනය | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | නිවාඩු ලේඛනය | ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1.7 වගන්තිය |
| උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | විශ්‍රාම වැටුප් අනත්දරු ලේඛනය | අංක 13/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය |

3.2 විගණන විමසුම්වලට පිළිතුරුදීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 02 කට 2016 ජූලි 31 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.117,000,000 ක් වී තිබුණි.

3.3 විසර්ජන ගිණුම

3.3.1 අයවැය විචලනය

ප්‍රාග්ධන වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.150,000,000 ක ශුද්ධ ප්‍රතිපාදනය උපයෝජනය කිරිම නිසි පරිදි සැලැසුම් නොකිරිම නිසා, ඉන් රු.9,500,000 ක් පමණක් වැය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් අදාළ කාර්ය ඉටු නොකිරිම නිසා රු.140,500,000 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

3.3.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන

වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2014 වර්ෂයේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ලබා දී තිබුණු ප්‍රතිපාදන මගින් විවිධ ව්‍යාපෘති සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 කින් මිලදී ගත් රු.7,047,508 ක් වටිනා

භාණ්ඩ අයිතම් 1465 ක්, 2016 මාර්තු 31 දින වන විටත් ප්‍රතිලාභීන්ට බෙදා නොහැර නිෂ්කාර්යව පැවතුණි.

(ආ) 2014 වර්ෂයේ මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක ක්‍රියාත්මක වූ ව්‍යාපෘතිවලින් රු.552,587,882 ක්වූ ව්‍යාපෘති 377 ක් අවිච්ඡේදව පැවැති අතර එම ව්‍යාපෘති 377 න් 2015 වර්ෂයේදී ප්‍රමුඛතා ගතකර ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති 169ක් වෙනුවෙන් රු.138,140,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකතුව රු.5,824,190 ක්වූ ව්‍යාපෘති 02 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද, ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.26,595,856 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

(ඇ) විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දින 100 යේ වැඩසටහනට සමගාමීව දේවගිරිය කුඹුරුපොල සුසාන භූමියට යන මාර්ගය කොන්ක්‍රීට් කිරීමට ලද රු.490,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම මාර්ගයේ පළමු මීටර් 8ක ප්‍රමාණයේ පාදම නියමිත ප්‍රමිතියෙන් සකස් කර නොතිබුණි. මේ නිසා මාර්ගය ඉරිතලා ගිලා බැස තිබූ බැවින්, පාදම මට්ටම් කිරීම සඳහා ගෙවන ලද රු. 9,212 ක් හා අදාළ කොටසේ මාර්ග කොන්ක්‍රීට් කිරීම සඳහා ගෙවන ලද රු. 51,960 ක මුදල ඵල රහිත වියදමක් වී තිබුණි.

(ඈ) නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයෙන් ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පිළිවෙලින් රු.1,580,000 ක් හා රු.980,000 ක් වැය කර වැල්ලෙවෙල සේවා පියස හා ඉලුක්කුඹුර ප්‍රජා ශාලාව ඉදිකර තිබුණි. ඇස්තමේන්තු පරිදි එම ගොඩනැගිලිවල ජනෙල් හා දොරවල් පළමු පංතියේ දැව යොදා මනා නිමාවකින් නිම කළ යුතු වුවද, භෞතික පරීක්ෂාවේදී ජනෙල් හා දොරවල් සඳහා හඳුනාගත නොහැකි වූ නොමේරු දැව යොදා තිබුණි.

(ඉ) අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.463,005 ක් වැය කර පල්ලේ අස්වැද්දුම බටගොල්ල ඇල මාර්ගය හා අමුණ සකස් කර තිබුණි. ඇල මාර්ගයේ අවසන් මීටර් 32 ක කොටස කොන්ක්‍රීට් යොදා නිම කර තිබුණි. ඇල මාර්ගයකට උචිත ආකාරයේ තාක්ෂණය භාවිතා නොකිරීම හා ඇල මාර්ගය සකස් කර ඇති කොන්ක්‍රීට් නිර්මිතයන් අවශ්‍ය ප්‍රමාණයට වඩා උස්ව ඉදිකර තිබීම නිසා ජලය බැස යාම නිසි පරිදි සිදු නොවීම නිසා ඇළ මාර්ගය සැලසුම් කර ඉදිකරන ලද්දක් නොවන බව නිරීක්ෂණය විය.

(ඊ) 2014 වර්ෂයේ පළාත් නැගුම සංවර්ධන යෝජනා යටතේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉනාමළුව ග්‍රාමීය ළමා හා මාතෘ සායන මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු. 1,960,344 ක ඇස්තමේන්තුවක් මත, රු.1,477,148ක් වැයකර ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. ගොඩනැගිල්ලේ බිත්ති කපරාරු කිරීම, සියලු උපාංග සහිතව ජනෙල් දොරවල් හා අනෙකුත් උපාංග සවිකිරීම සිදුකර නොතිබූ බැවින් මෙම ගොඩනැගිල්ල 2015 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රයෝජනයට ගත නොහැකිව පැවතුණි.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 25901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,302,681 ක් වී තිබුණි. එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 14 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

## 3.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.5.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 ජූනි 14 දින අමාත්‍යවරයා විසින් අත්සන් කර තිබුණි.

## 3.6 වත්කම් කළමනාකරණය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| (i) ගොඩනැගිලි | 01 | වර්ෂ 1 1/2 |
| (ii) යන්ත්‍ර සූත්‍ර | 02 | මාස 06 ක සිට අවු. 1 1/2 |

**(ආ) බත්ගම්පල සහල් සැකසීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම**

2007 හා 2008 වර්ෂවල ආරම්භ කර තිබුණු විල්ගමුව ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පිහිටි බත්ගම්පල සහල් සැකසීමේ මධ්‍යස්ථානය සඳහා 2010 වර්ෂය වනවිට රු.1,673,219ක් වැය කර ඉදිකර තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විටත් එම ගොඩනැගිල්ල බදු දී නොතිබුණි. භෞතික පරීක්ෂාවේදී එම ව්‍යාපෘතිය වෙනුවෙන් ඉදිකළ ගොඩනැගිල්ල, කමත, ජලටැංකිය මෙන්ම සහල් නිෂ්පාදන යන්ත්‍ර 02 ක් නිෂ්කාර්යව පැවතීම නිසා විනාශවීමේ අවදානමකට ලක්ව පැවැතුණි. රු.330,000 කට මිලදී ගෙන තිබුණු යන්ත්‍ර රු.40,000 කට තක්සේරු කර තිබීම නිසා රු.290,000 ක මූල්‍ය පාඩුවක් ද සිදුවී තිබුණි. මේ හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා වැය කළ සමස්ථ වියදම නිෂ්ඵල වී තිබුණි

**(ඇ) පේෂකර්මාන්ත මධ්‍යස්ථානය ආරම්භ නොකිරීම**

පළාත් නැගුම වැඩසටහන යටතේ නාවුල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පේෂකර්ම මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා 2014 දෙසැම්බර් 31 දින රු.1,456,607ක් වටිනා මහන මැෂින් 43 ක් හා කතුරු 11 ක් මිලදී ගෙන තිබුණි. 2016 ජූනි මාසය වන විටද පේෂකර්ම මධ්‍යස්ථානය ආරම්භ කර නොතිබුණි.

**(ඈ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2008 වර්ෂයේදී රු.625,338ක් වැය කර ඉදිකර තිබූ ජල ව්‍යාපෘතිය සඳහා භාවිතා කළ රු.65,000ක් වටිනා ජල මෝටරය නාඋල ප්‍රාදේශීය සභාවේ, උප සභාපතිවරයා විසින් රැගෙන ගොස් සමාලෝචිත වර්ෂය අවසාන වන විට වර්ෂ 06 ක කාලයක්ගතවී තිබුණි. ඒ සම්බන්ධයෙන් කිසිදු නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**(ඉ) ගිණුම්ගත නොකළ වත්කම්**

2015 දෙසැම්බර් මාසයේදී පරිත්‍යාගයක් ලෙස චීන රජයෙන් ලැබී තිබූ ඩීසල් ජෙනරේටරය තක්සේරු කර ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි.

**3.7 බේරුම් නොකළ බැරකම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2015 දෙසැම්බර් 31 දින වන විට එළඹ තිබුණු වර්ෂයකට අඩු කාලයක සිට පැවත එන බේරුම් නොකළ රු.895,281ක්වූ බැරකම් පැවතුණි.

**3.7 අනුකූල නොවීම්**

(අ) නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | |
| | XIX වන පරිච්ඡේදයේ 5.4 හා 5.4.1 වගන්ති | - | නිවාස ලිපිගොනුවල කලත්‍රයා පිළිබඳ විස්තර, නිලධාරියාගේ සිවිල් තත්ත්වය පිළිබඳ කිසිදු ලියවිල්ලක් ඉදිරිපත් නොකිරීම නිසා කලත්‍රයාගෙන් නිවාස කුලී අයවීමක් සිදු වී තිබේද යන්න තහවුරු කර ගැනීමට නොහැකි විය. |
| (ii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | මුදල් රෙගුලාසි 880 | 50,000 | ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් 05 දෙනෙකුගෙන් ඇප ලබා ගෙන නොතිබුණි. |
| (iii) | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාලේගේ චක්‍රලේඛ | | |
| | 2013 සැප්තැම්බර් 20 දිනැති අංක 03/2013 දරන චක්‍රලේඛය | 17,488<br>(මාසිකව) | පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අනත් දරුවන්ට හිමි විශ්‍රාම වැටුප් දීමනාව මවගේ ගිණුමට බැර කර තිබුණි. |

(ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

-------------------------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 මාර්ගෝපදේශය අනුව එකතු කළ අගය මත බදු මුදල් ගෙවීමෙන් පසු ඊළඟ මාසයේ 15 වන දින හෝ එදිනට පෙර එකී ගෙවීම් පිළිබඳ විස්තර විගණකාධිපතිවරයාට පිටපත් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත දැනුම් දිය යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2 ක අවස්ථා 6 කදී රු.11,377 ක එකතු කළ අගය මත බදු ගෙවීම් සම්බන්ධ විස්තර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත යවා නොතිබුණි.

3.8 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

---------------------------------------------------------

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම හා ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම

---------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළයුතු වූ දිනය | ආරම්භ නොකිරීමට හේතු කෙටියෙන් |
|---|---|---|---|
| | රු. | | |
| ගන්සරපොල පානීය ජල යෝජනා ක්‍රමය (රත්තොට) | 500,000 | 2014 වර්ෂය | ජල මූලාශ්‍රයේ ජලය ලබා ගැනීමේ ගැටළුකාරි ස්වරූපය |
| ගෙඩිගස්වලාන එම්.ජී.මුදන්නායක මයාගේ නිවස ඉදිරිපිට බෝක්කුව හා වාන් ඇළ සකස් කිරීම (දඹුල්ල) | 600,000 | 2015 වර්ෂය | ආරම්භ කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබීම |
| කෙකෝලේ මාර්ගය ඉදිකිරීම (පල්ලේපොල) | 600,000 | 2014 වර්ෂය | ගම්වාසීන්ගේ උනන්දුවක් නොමැති වීම |
| තැඹිලිදෙණිය උතුර ජල යෝජනා ක්‍රමයට මෝටරයක් ලබා දීම (පල්ලේපොල) | 700,000 | 2014 වර්ෂය | ප්‍රතිපාදන නොලැබීම |
| දිවුල්ගමුව ජල යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීම (පල්ලේපොල) | 500,000 | 2014 වර්ෂය | ප්‍රතිපාදන නොලැබීම |
| අළුත්ගම වසමේ හපුගස්යාය තලාකොළයායේ පාර සැකසීම (පල්ලේපොල) | 300,000 | 2014 වර්ෂය | අයහපත් කාලගුණික තත්ත්වය |

| | | | |
|---|---|---|---|
| මානින්ගමුව බටහිර පට්ටියලන්ද මාර්ගය සංවර්ධනය කිරීම (පල්ලේපොල) | 300,000 | 2014 වර්ෂය | අයහපත් කාලගුණික තත්ත්වය |
| ගොඩවාල ගම්මැද උතුරු හන්දිය දක්වා වූ මාර්ගය සංවර්ධනය (පල්ලේපොල) | 300,000 | 2014 වර්ෂය | අයහපත් කාලගුණික තත්ත්වය |
| බණ්ඩාරපොල මහ විදුහලේ පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීම (දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) | 8,250,000 | 2015 වර්ෂය | ඇස්තමේන්තුගත නොකරන ලද වැඩ කොටස් සිදු කිරීම |
| තල්කොටේ ගල්හේන සියඹලාගලයාය සහ ඇහැලගලයායට යන මාර්ගය බොරළු දමා සැකසීම (දඹුල්ල) | 194,690 | 2014 වර්ෂය | ඉඩම් ගැටළු පැවතීම හා සමිතියේ නිලධාරි මණ්ඩලය වෙනස් වීම |
| | -------------- | | |
| | 12,244,690 | | |
| | ======== | | |

(ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක් විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණත්, එම ව්‍යාපෘති නිම නොකර අතහැර තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භක දිනය | 2015.12.31 දිනට වියදම | අත්හැර දැමීමට හේතුව |
|---|---|---|---|---|
| | රු. | | රු. | |
| මානින්ගමුව බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම (පල්ලේපොල) | 1,500,000 | 2014 | 252,423 | ප්‍රතිපාදන නොලැබීම |
| කෙන්ට් වත්ත මාර්ගය ඉදිකිරීම (පල්ලේපොල) | 500,000 | 2014 | 66,510 | ප්‍රතිපාදන නොලැබීම |
| ඇල්කඩුව නගරයේ ක්‍රීඩා පිටියක් ඉදිකිරීම (උකුවෙල) | 6,000,000 | 2014 | 2,206,686 | ප්‍රතිපාදන නොලැබීම |

| | | | | |
|---|---|---|---|---|
| කළල්පිටිය හෙළ බොජුන්හල (උකුවෙල) | 3,527,900 (ප්‍රතිපාදන ලැබීම් 2014/2015) | 2014 | 3,527,900 | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම |
| ගලඋඩහේන හා බ්‍රැන්ඩිගල ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස සංවර්ධනය කිරීම (උකුවෙල) | 5,000,000 | 2014 | 1,311,652 | අකාර්යක්ෂමතාව නිසා ඇති වූ අසාමාන්‍ය ප්‍රමාදය |
| ලේනදොර උතුරු සේවා පියස ඉදිකිරීම (දඹුල්ල) | 1,250,000 | 2015.10.08 | 218,431 | අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් නියමිත දිනට වැඩ අවසන් කිරීමට නොහැකි වීම හා 2015 වර්ෂයේ අවිච්ඡේද කිරීමට අවසර ලබා නොදීම. |
| නිකවටවන සායන මධ්‍යස්ථාන නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම- (දඹුල්ල) | 1,250,000 | 2015.11.02 | 351,625 | අයහපත් කාලගුණික තත්ත්වය |
| කායන්වෙල වැව ගැඹුරු කිරීම (දඹුල්ල) | 1,184,165 | 2015.10.30 | 407,841 | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව වැඩ නතර කිරීම |
| පෙරළිගල අමුණ සෑදීම . (දඹුල්ල) | 946,379 | 2015.10.28 | 314,525 | සමතියේ නිලධාරි මණ්ඩලය වෙනස් වීම මත ව්‍යාපෘතිය මුදලට එකඟ නොවීම |
| | -------------- | | ------------ | |
| එකතුව | 21,158,444 | | 8,657,953 | |
| | ======== | | ======= | |

(ඇ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

---------------------------------------------------------------------

ඉදිකිරීම් සම්බන්ධව විවිධ ආයතනවලට සහ ලංකා විදුලිබල මණ්ඩලය වෙත මුදල් නිදහස් කර තිබුණත්, එම කාර්යයන් ඉටු කිරීම පිළිබඳ නිසි ප්‍රගතියක් වාර්තාගත නොවූ අවස්ථා පහත දැක්වේ.

(i) උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විදුලි ව්‍යාපෘති දෙකක් වෙනුවෙන් ලංකා විදුලි බල මණ්ඩලයට වෙත 2014 වර්ෂයේදී රු.617,824 ක් ගෙවා තිබුණද, 2016 මාර්තු 04 දින වන විටද අදාළ විදුලි සම්බන්ධතා ලබා දී නොතිබුණි.

(ii) උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ගලඋඩහේන සහ බ්‍රැන්ඩිගල ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස සංවර්ධනය කිරීමට මූලික උද්‍යාන කටයුතු ආරම්භ කිරීම වෙනුවෙන් රු.5,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට හා අනෙකුත් මූලික කටයුතු ඉටුකිරීම වෙනුවෙන් ආයතන 04 කට 2014 දෙසැම්බර් 31 දින වන විට රු.1,311,652 ක් ගෙවා තිබුණි. 2016 මැයි මාසය වන විටද එහි කිසිදු නිර්මාණ කටයුත්තක් සිදුකර නොතිබුණි. උද්‍යාන නිර්මාණ කටයුතු සඳහා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත 2014 වර්ෂයේදී ලබා දී තිබුණු මුදල ඔවුන්ගේ තැන්පත් ගිණුමේ සුරක්ෂිතව තබා ඇති බව පිළිතුරු ලිපියේ දක්වා තිබුණි.

3.9 **කාර්යසාධනය**

**-----------------**

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

-----------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සිය අරමුණුවලට අදාළ කාර්යවලින් බැහැරව ක්‍රියා කළ අවස්ථා නිරීක්ෂණය වූ අතර, නියැදි විගණන පරීක්ෂණවලදී එසේ අනාවරණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) පළාත් නැගුම සංවර්ධන වැඩසටහන යටතේ රු.8,763,115 ක් වැය කර විල්ගමුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණි. නමුත් ජනතාව ඒකරාශිවන ස්ථානයකට උචිත අයුරින් වාතාශ්‍රය හා ආලෝකය ලැබීමට හැකිවන පරිදි මෙම ගොඩනැගිල්ල ඉදිකර නොතිබූ අතර එය ගබඩා මධ්‍යස්ථානයක් ලෙසින් බාහිරට දිස්විය. කෙසේ වුවද 2016 අප්‍රේල් මාසය වන විටද මෙම ගොඩනැගිල්ල භාවිතයට ගෙන නොතිබුණි.

(ii) දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ටී.බී. තෙන්නකෝන් පදනමට 2008 වර්ෂයේ සිට දිගුකාලීන බදු පදනමකට ලබා දී තිබූ ඉඩමක 2014 වර්ෂයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් සලසා තිබුණු රු.මිලියන 36 ක ප්‍රතිපාදනවලින් සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදිකිරීමට අනුමත කර ඒ සඳහා රු.11,786,165 ක් වැය කර තිබුණි. 2015 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය සඳහා කිසිදු වියදමක් කර නොතිබුණි. දැනට ගොඩනැගිල්ලේ මූලික ආකෘතිය පමණක් සකස් කර ඇති බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. ඉඩමේ නිරවුල්භාවය, යෝග්‍ය කොන්ත්‍රාත්කරුවකු තෝරා නොගැනීම හා රාජ්‍ය නිලධාරීන්ගේ වගකීම් නිසියාකාරව ඉටු නොකිරීම යන කරුණු මත අවුරුදු 02 කට අධික කාලයක් සිට අත්හැර දැමූ අපේක්ෂිත අරමුණු ඉටු නොවූ ව්‍යාපෘතියක් වශයෙන් විගණනයේදී නිරීක්ෂණය විය.

(iii) අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ රු.1,960,000 කට පුස්සැල්ල පේෂකර්ම මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණද, අදාළ අත් යන්ත්‍ර උපකරණ ලබා නොදීම නිසා 2016 ජූලි මාසය වන විටද ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකිවීමෙන් ගොඩනැගිල්ල අරමුණුගත කාර්යයට යොදා ගැනීමට නොහැකි වි තිබුණි.

(ආ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්
-----------------------------------------------------
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණ අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට නව පරිපාලන සංකීර්ණයක් ඉදිකිරීම සඳහා රු.මිලියන 550 ක ඇස්තමේන්තුවක් යටතේ 2011 වර්ෂයේදී යෝජනා වී 2013 වර්ෂය වන විට රු.මිලියන 9 ක් හා 2015 වර්ෂයේ රු.මිලියන 150 ක් වාර්ෂික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සලසා තිබුණි. මෙම ඉදිකිරීම් සම්බන්ධව පවතින මන්දගාමී ස්වභාවය හා කාර්යක්ෂම වැඩපිළිවෙලක් නොමැතිවීම හේතුවෙන් 2013 වර්ෂයේ ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගෙන නොතිබූ අතර 2015 වර්ෂයේ ප්‍රතිපාදනවලින් රු. මිලියන 9.5 ක් පමණක් වැය කර තිබුණි.

(ii) 2014 වර්ෂයේ පළාත් නැගුම වැඩසටහන යටතේ උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක ගොවීන්ට හා වතු සේවකයින්ට "අව්වෙන් හා වැස්සෙන් ආරක්ෂා වීමට හිස් වැසුම් සැපයීම" වෙනුවෙන් රු.910,000 ක් වැය කර ඉඳිකොල තොප්පි 1400 ක් මිලදී ගෙන තිබුණි. ඉන් රු.455,000 ක් වටිනා තොප්පි 700 ක් 2016 මැයි මාසය අවසාන වන විටද බෙදාහැර නොතිබුණි. එම තොප්පි පාවිච්චි කළ නොහැකි ආකාරයට දිරාපත් වී කෘමි උවදුරුවලට ලක්වෙමින් ගබඩාවේ පැවතුණි.

(iii) දේශීය ආහාර ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීමේ වැඩසටහන යටතේ ජනතාවට දේශීය ආහාර ලබාදීමේ අරමුණින් උකුවෙල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ හෙළ බොජුන් හලක් ස්ථාපනය කිරිම සඳහා 2014 හා 2015 වර්ෂවල රු.3,527,900 ක මුදලක් වැය කර තිබුණි. 2016 මාර්තු මාසය වන විටත් මෙම ගොඩනැගිල්ල අවශ්‍ය අරමුණුගත කාර්යයට යොදාගෙන නොතිබුණි.

(ඇ) සැලසුම් කිරීම
-----------------
2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කර නොමැති අවස්ථා නිරීක්ෂණ විය. විස්තර පහත දැක්වේ.

(i) 2015 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව, කෘෂිකර්ම ඒකකය මගින් වැඩසටහන් අටක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, ඉන් වැඩසටහන් 03 ක් ක්‍රියාත්මක කර නොතිබූ අතර වැඩසටහන් 04 ක් අපේක්ෂිත ඉලක්ක කරා ලඟාවීමට නොහැකි වී තිබුණි.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නඩත්තු හා අලුත්වැඩියාවන් යටතේ රජයේ නිවාස 22 ක් අලුත්වැඩියා කිරීමට සැලසුම් කර තිබුණද, 2015 වර්ෂයේ දී ඉන් 15 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

3.10 මතභේදයට තුඩුදෙන ගනුදෙනු
----------------------------------
ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කළුගහ ව්‍යාපෘතියට ඉඩම් අත්පත් කරගන්නා ප්‍රදේශවල ජනතාවට වන්දි ගෙවා ජනතාව එම ප්‍රදේශයෙන් ඉවත් කර තිබියදී, පල්ලේකුඹුරේ ප්‍රධාන ඇල මාර්ගය හා ඇතුල් පෝටාව ඉදිකිරීම සඳහා රු.490,000 ක් වැය කර තිබුණි.

(ආ) 2015 වර්ෂයේ දින 100 වැඩසටහන යටතේ රු.500,000 ක ප්‍රතිපාදන මත රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගන්සරපොල තැන්නවත්තේ පොකුණේ ළිඳ හා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සිදුකර තිබුණද, එහි අත්‍යාවශ්‍යයෙන්ම ප්‍රතිසංස්කරණය කළයුතු ළිඳ ආසන්නයේ පවතින කුඹුරු බිමේ මාර්ග කොටස ප්‍රතිසංස්කරණය නොකර පහසුවෙන් ගමන් කළහැකි ස්ථානයක් ප්‍රතිසංස්කරණය කර තිබුණි.

3.11 පාඩු හා හානි

----------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිපුනතා ප්‍රවර්ධන ඒකකයේ තිබී 2013 වර්ෂයේ අස්ථානගත වූ එකතු වටිනාකම රු.87,994 ක් වූ පරිගණක යන්ත්‍රය හා උපාංගවල වටිනාකම වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අයකර ගැනීමට හෝ විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීමට 2016 ජූනි මාසය වන විටද කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 හා 2014 වර්ෂවල සිදුවූ සිද්ධීන් 2 කට අදාළ රු.231,951 ක් වූ හානි සම්බන්ධයෙන් 2016 ජූලි මාසය වන විටත් කපා හැරීමට හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.12 අනාර්ථික ගනුදෙනු

-----------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.980,000 ක් වැය කර ඉදිකර තිබූ අලවත්තාපිටිය රජයේ ඉඩමේ පොහොර ගබඩාව ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ඇල්කඩුව නගරයේ රු.4,199,570ක ඇස්තමේන්තුවක් යටතේ ක්‍රීඩා පිටියක් ඉදිකිරීම ආරම්භ කර තිබුණි. ඒ සඳහා 2014 වර්ෂයේදී රු.2,206,686 ක් වැය කර තිබුණද, 2015 වර්ෂයේදී කිසිදු වියදමක් කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉදිකිරීමේ කටයුතු අත්හැර තිබුණි. 2015 ජූනි 09 දින වන විට කොන්ත්‍රාත්කරුගේ රක්ෂණාවරණය ද නිදහස් කරගෙන තිබුණි.

(ඇ) නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ග්‍රාමීය ජනතාවට පානීය ජල පහසුකම් ලබා දීම සඳහා 2008 වර්ෂයේදී රු. 625,338 ක් වැය කර ඉදිකර තිබූ ලිහිණිපිටිය ජල යෝජනා ක්‍රමයට හා 2012 වර්ෂයේ රු.980,000 ක් වැය කර ඉදිකර තිබූ ඕපල්ගල ජල යෝජනා ක්‍රමයට 2014 වර්ෂයේ පිළිවෙලින් රු.15,000,000 ක් හා රු.1,000,000 ක් වශයෙන් අතිරේක ප්‍රතිපාදන ලැබී තිබුණි. එම ප්‍රතිපාදන උපයෝගි කරගෙන ව්‍යාපෘති අවසන් නොකිරීම නිසා ලිහිණිපිටිය ජලයෝජනා ක්‍රමය වර්ෂ 8 ක් හා ඕපල්ගල ජල යෝජනා ක්‍රමය වර්ෂ 4 ක් මුළුල්ලේ ප්‍රතිලාභීන්ට ප්‍රයෝජනයට ගැනිමට නොහැකි වී තිබුණි.

(ඈ) රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බෝධිකොටුව ග්‍රාම නිලධාරි වසමේ “රිටිගහ ඇල” 2011 වර්ෂයේ නාය යාම හේතුවෙන් කුඹුරුවලට ජලය සැපයීම සඳහා රු.4,497,338 ක් වැය කර 2011 දෙසැම්බර් 02 දින වන විට ඉදිකර තිබූ නල ජල මාර්ගය 2015 දෙසැම්බර් මාසය වන විටත් නිෂ්කාර්යව පැවැතුණි. එමෙන්ම එලන ලද ජල නල ප්‍රයෝජනයට ගත නොහැකි

අයුරින් විනාශ කර තිබුණි. මේ හේතුවෙන් ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වූ අරමුණ ඉටු වී නොතිබුණි.

(ඉ) මාතලේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් මාතලේ මහනගර සභාව ඉදිරිපිට ඇති පැරණි “ සාක්ෂි මඩුව ” ගොඩනැගිල්ල 1980 වර්ෂයේ සිට වාර්ෂික බදු බලපත්‍රයක් මත මහනගර සභාවට බදු දී තිබූ අතර 1997 හා 1998 වර්ෂවලට අදාළව අයවිය යුතු හිඟ බදු මුදලද ඇතුළත්ව 2015 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු මුළු හිඟ බදු මුදල රු.180,000 ක් වී තිබුණි. 2016 ජුනි මාසය වන විටද මෙම බදු මුදල් අයවී නොතිබුණි.

## 3.13 කළමනාකරණ දුර්වලතා

රජයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් ඉඩම් පවරා ගැනීමේදී මාතලේ, ලග්ගල, ගලේවෙල, පල්ලේපොල, නාඋල, රත්තොට, දඹුල්ල හා උකුවෙල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අවස්ථා 25 කදී වර්ෂ 06 ක සිට වර්ෂ 32 ක් දක්වා කාල ප්‍රමාදයක් සිදු වී තිබුණත්, පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

## 3.14 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 52 | 45 | 07 |
| (ii) | තෘතියික මට්ටම | 29 | 18 | 11 |
| (iii) | ද්විතියික මට්ටම | 1,099 | 1,084 | 15 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 113 | 109 | 04 |
| | **එකතුව** | **1293** | **1256** | **37** |